
නෙත් FM

# 5 පහේ පන්තිය

❖ **පහත ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

01) 

මෙම රූපයේ දැක්වෙන බීජය වන්නේ,

1. හොර
2. මොනරකුඩුම්බිය
3. පුළුන්

02) දුරකථනය සොයා ගත් පුද්ගලයා වන්නේ,

1. ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්
2. තෝමස් අල්වා එඩිසන්
3. ජෝන් ලොගී බෙයාර්ඩ්

03) සුසන්තිකා ජයසිංහ ඔලිම්පික් පදක්කමක් දිනා ගත්තේ,

1. උස පැනීමෙනි.
2. මීටර 200 කෙටි දුර දිවීමෙනි.
3. මීටර 100 කෙටි දුර දිවීමෙනි.

04) වර්ෂාවක් ආසන්න වන විට පොළොවෙන් විශාල වශයෙන් මතුවන සතා කවු ද?

1. මැස්සා 2. ගැඩවිලා 3. මෙරු

05) බඩ ගා යන සතෙක් වන්නේ,

1. මැඩියා 2. ඉබ්බා 3. ලේනා

06) සිත් පහන් කිරීමේ ක්‍රියාවලියේ පළමු වන අවස්ථාව වන්නේ,


1. උදානය 2. ශාරීරික ලිහිල් බව 3. ප්‍රාර්ථනාව

07) රෝද දෙකක් සහිත වාහනයක් වන්නේ,

1. බසය 2. යතුරු පැදිය 3. ත්‍රී රෝද රථය

PAPERMASTER.LK

08) මෙහි දැක්වෙන මැහුම් ක්‍රමය වඩාත් සුදුසු වන්නේ,



1. ඉරුණු ඇඳුමක් මැසීමට
2. බොත්තම් කාසයක් මැසීමට
3. ඇඳුමක වාටියක් මැසීමට

09) අපේ රාජ්‍ය ලාංඡනයේ පුන්කලසින් සංකේතවත් වන්නේ,
1. සෞභාග්‍යය හා පරිපූර්ණ බව
2. සදාතන පැවැත්ම
3. ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය

10) ආරක්ෂාකාරී ලෙස යම් කෙනෙකුට පණිවිඩයක් යැවීමට යොදා ගත හැකි ක්‍රමය වන්නේ,
1. සාමාන්‍ය තැපෑලේ ලිපියක්
2. විවෘත තැපෑලේ ලිපියක්
3. ලියාපදිංචි තැපෑලේ ලිපියක්

11) කොළඹ මෝදර ප්‍රදේශයෙන් මුහුදට වැටෙන ගංගාව වන්නේ,
1. මහවැලි 2. කැලණි 3. කළු

12) හජ්ජි උත්සවය පවත්වනු ලබන්නේ,
1. බෞද්ධ ආගමිකයන් 2. ඉස්ලාම් ආගමිකයන් 3. හින්දු ආගමිකයන්

13) ක්ෂීරපායී සතෙකු සපාකෑමෙන් ඇති විය හැකි රෝගයක් වන්නේ,
1. ජලභීතිකාව 2. මැලේරියාව 3. ඩෙංගු

14) ආඩියා ළිඳ බහුල වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන්නේ,
1. නුවරඑළිය ප්‍රදේශයේ ය. 2. මාතර ප්‍රදේශයේ ය. 3. යාපනය ප්‍රදේශයේ ය.

15) වාහනයක තිරිංග යොදන විට දැල්වෙන බල්බයේ වර්ණය වන්නේ,
1. තැඹිලි 2. සුදු 3. රතු

16) මේරූ අතු පැළ කර ගනු ලබන්නේ,
1. රෝස 2. දොඩම් 3. පිහිඹියා

17) කතරගම පූජා නගරය අයත් වන පළාත වන්නේ,
1. දකුණ 2. ඌව 3. නැගෙනහිර


18) ධාතුසේන රජතුමා විසින් ඉදිකළ වැවක් වන්නේ,
1. කලා වැව 2. කන්තලේ වැව 3. ගිරිතලේ වැව

19) එල්ලේ ක්‍රීඩාවේ එක් පිළකට අයත් වන ක්‍රීඩකයන් සංඛ්‍යාව වන්නේ,
1. 06 2. 07 3. 16

20) වර්තමානයේ පාර මාරු වීම සඳහා යොදා ඇති රේඛාවල වර්ණය,
1. කහ 2. සුදු 3. රතු


PAPERMASTER.LK

21) මෙම පොලිස් නිලධාරියා විසින් නිකුත් කරනු ලබන මාර්ග සංඥාව වන්නේ,



1. ඉදිරියෙන් එන වාහන නතරවෙනු.
2. පසුපසින් එන වාහන නතරවෙනු.
3. ඉදිරියෙන් හා පසුපසින් එන වාහන නතරවෙනු.

22) වගාවට හිතකර සතෙක් වන්නේ,
1. ගොළුබෙල්ලා 2. දළඹුවා 3. මී මැස්සා

23) 

මෙහි දැක්වෙන ශාක පත්‍ර වන්නේ,
1. කොහොඹ
2. සියඹලා
3. පොල්පලා

24) අයිස් කැට කිහිපයක් ජලයට දැමූ විට එම අයිස් කැට,
1. ජලයේ යට යයි. 2. පුපුරයි. 3. ජලයේ පාවෙයි.

25) ඇණ ගැසීමට මෙන් ම ඇණ ගැලවීමට ද භාවිත කරයි.
1. ගල් මිටිය 2. ඉස්කුරුප්පු නියන 3. අඬු මිටිය

26) අතීතයේ දී ජලය පිරිසිදු කර ගැනීම සඳහා භාවිත කළ ක්‍රමයක් නොවන්නේ මින් කුමක් ද?
1. ජලයට අඟුරු දැමීම
2. ජලයට ඉඟිනි ඇට දැමීම
3. ජලයට ක්ලෝරීන් දැමීම

27) වඩු කාර්මිකයන් පාවිච්චි කරන උපකරණයක් වන්නේ,
1. ලඹය 2. කිනිහිරය 3. වරක්කලය

28) විවිධත්වයෙන් යුතු ආහාර වේලක් නොගැනීම නිසා සිදුවිය හැකි බලවත් ම හානිය කුමක් ද?
1. රසය අඩු වීම
2. අධික මුදලක් වැය වීම
3. අවශ්‍ය පෝෂණය නොලැබීම

29) ශ්‍රී ලංකාව බෙදා ඇති පළාත් ගණන වන්නේ,
1. 09 කි. 2. 08 කි. 3. 07 කි.

30) සිතියම්වල ගංගා දැක්වීමට යොදා ඇති සම්මත වර්ණය වන්නේ,
1. රතු 2. දුඹුරු 3. නිල්

PAPERMASTER.LK